Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

විෂය - නර්තනය

සතිය-2021-05-10 - 2021-05-14

ශ්‍රේණිය 12

**Prepared by-** P.L. ASHA NISHANTHI

නිපුණතාව 06 — නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 6.04 — දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් නිර්දේශිත ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

ක්‍රියාකාරකම — බලි ශාන්තිකර්මය.

**නිවැරිදි පිළිතුර තෝරන්න.**

1. බලි උපතේ විශේෂ කීයක් තිබේද ?

   1.අසු හාර දාහකි 2.හැටනව දාහකි 3. පහලොස් දාහකි 4. විසි හතර දාහකි.

2. සිකුරු ග්‍රහයාට අයත් වර්ණය වන්නේ 1 රතු 2.නිල් 3. සුදු 4.කහ

3. බලි ශාන්ති කර්මය ආරම්භ කිරිමට පෙර සිදු කරනු ලබන්නේ

   1. බලි මැස්ස තැනීම 2.බලි කපක් සිටුවීම 3.මැටි සොයා ගැනීම 4.ද්‍රව්‍ය තීරණය කිරීම

4. එක් එක් බලියේ ස්වභාවය පිළිබඳ වර්ණනා කෙරෙන කවි 1. කඩතුරා කවි 2.හිං හතරේ කවි 3. ඇඹුම් කවි 4. මඩු පුර කවි

5.බලි ශාන්ති කර්මයේ දි විශේෂ ස්ථානයක් හිමි වන්නේ 1. ගායනයට 2. වාදනයට 3. බලි ඇඹීමට 4. පාට කිරිමට

**හිස් තැනට සුදුසු පිළිතුර යොදන්න.**

6 . ගැබිණි මවකගේ මනෝ භාවය සකස් කිරීමට යෝග්‍ය වන්නේ ----------- බලියයි.

7 ලක්දිව බලි උපතට කෝට්ටේ රාජධානියේ විසු ----------- සහ ------------- හිමි වරු සම්බන්ධ බව ජනප්‍රවාදයේ ඇත.

8. ග්‍රහයින් සඳහා කරනු ලබන ප්‍රධාන ශාන්ති කර්මය -------------- වේ .

9.යම වායු කාල මුර්තු යන කවි වලින් -------------- පිළිබඳ විස්තර වේ .

10. කොලොන් විමානයේ වෙසෙන්නේ ---------- ග්‍රහයයි.

**ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.**

11. බලි ශාන්තිකර්මයේ ගායනයේ හා නර්තනයේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

12. **බලි ඇදුරා පරිපූර්ණ කලා කරුවෙකි** . මෙම කියමන සනාථ කරන්න.

13. ඒ ඒ ග්‍රහයින්ට අයත් විමාන නම් කරන්න .

14. බලි වර්ණ ගැනවිම සඳහා ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය මොනවාද?